තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය

එන් .ඩබ්ලිව් . සි .පි .ලංකා එ. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/1367/19 (2019.10.08 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී.හපුආරච්චි

**අභියාචක** - එන් .ඩබ්ලිව් . සි .පි .ලංකා
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි - භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

**පෙනීසිටීම**
අභියාචක - පැමිණ ඇත.
පොදු අධිකාරිය - පැමිණ නැත.

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019-01-07 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | නැත. |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019-01-30 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | නැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019-03-15 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2019-01-07 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

> *2017-12-29 යොමු AD /6/9/ පොදු/විනය සහිත රාජකාරී වැඩ තහනම් කිරීමට අදාලව ලැබී ඇති බරපතල විෂමාචාර ක්‍රියා සම්බන්ධ පැමිණිලි සහ එවැනි පැමිණිලි නොමැති නම් ඒ පිළිබඳ විස්තරාත්මක තොරතුරු*

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2019-01-30 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ

නිලධාරයාද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ අභියාචක ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් 2019-03-15 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචක පැමිණ ඇත. පොදු අධිකාරිය පැමිණ නැති බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබේ.

අභියාචක විසින් තමා ඉල්ලීම කළ තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් පොදු අධිකාරිය විසින් කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති බව කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී.

**නියෝගය:**

කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමට දන්වා ඇති අවස්ථාවක එසේ කිරීම පැහැර හැරීම තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 39(1) (ඇ) වගන්තිය ප්‍රකාරව 'මහේස්ත්‍රාත්වරයෙකු විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කොට රුපියල් පන්දහසක් නොඉක්මන දඩය හා බන්ධනාගාර ගත කිරීම යන දෙකටම' ලක්විය හැක වරදක් බව පොදු අධිකාරියෙහි අවධානයට ලක් කරනු ලැබේ. ඒ අනුව පොදු අධිකාරියෙහි නම්කල නිලධාරියාට මීලග කැදවීම් වාරයේ කොමිෂන් සභා විභාගය සදහා පැමිණීමට මෙයින් නියෝග කරනු ලැබේ.

අභියාචනයෙහි මීළඟ විභාග කිරීම සඳහා පැමිණ නොසිටීම සහ මෙම නියෝගයට අධිකාරිය මගින් නිසි ප්‍රතිචාරයක් නොදැක්වීම මගින්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ ඉහත සඳහන් වගන්ති යටතේ, පොදු අධිකාරියෙහි නම්කළ නිලධරයා සහ තොරතුරු නිලධරයාට අදාළව පියවර ගැනීමට සිදු වනු ඇත.

මීළඟ අභියාචනා විභාගය 2019.12.10 දිනට කල්තබනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****